රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND HOME AFFAIRS
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

දුරකථන / தொலைபேசி / Telephone : (94) 011-2696211-13
ෆැක්ස් / பெக்ஸ் / Fax : (94) 011-2695279
ඊ මේල් / இ-தபால் / E - mail : secretary@pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No : COM2/TRANS/03/0015
ඔබේ අංකය / உமது இல / Your No :
දිනය / திகதி / Date : 2010.02.12

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දිසාපතිවරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## 2010 වාර්ෂික ස්ථානමාරු - ඒකාබද්ධ සේවය

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය/කාර්යාල සේවක සේවය/රියදුරු සේවය

ඉහත කරුණ සම්බන්ධ මගේ අංක COM2/TRANS/03/0015, කාසේසේ/X5/වා.ස්.මාරු/2010, ඩීඑස්පී/වා.ස්.මා./2010/ඒ.සේ/V හා 2009.12.10 දිනැති ලිපිවලට ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත්ව ඇති බැවින් 2010 ජනවාරි 26 දින පවත්වන ලද ජනාධිපතිවරණය හේතුවෙන් කල් දමන ලද, 2010.01.01 දින සිට 2010.05.01 දින දක්වා කාලය තුල ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ 2010 වාර්ෂික ස්ථාන මාරු 2010.05.03 දින සිට ද, 2010.05.03 දින සිට 2010.06.01 දින දක්වා කාලය තුල ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ 2010 වාර්ෂික ස්ථාන මාරු, 2010.06.01 දින සිටද ක්‍රියාත්මක වන බව මෙයින් දන්වමි. ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවය කරන මාරුවීම් ලබා ඇති නිලධාරීන් අදාල දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි මුදා හැරීමට ක්‍රියා කරන මෙන් මෙයින් දන්වමි.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ මා විසින් දී ඇති ස්ථාන මාරු නියෝගවලට අමතරව අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග යටතේ කිසියම් නිලධාරියකුට ස්ථාන මාරුවක් ලැබී තිබුනේ වුවද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට යටත්ව ඒවා ක්‍රියාත්මක විය යුතු බවද සැලකුව මැනවි.

04. තවද නියමිත දිනයේදී අභිනව සේවා ස්ථානයේ රාජකාරි කටයුතු භාර ගැනීමට හැකිවන පරිදි දැනටමත් ස්ථානමාරු නියෝග ලැබ සිටින නිලධාරීන් ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොසිට ඔබ කාර්ය ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන මෙන් ද කාරුණිකව දන්වමි.

බී.පී.පී.එස්.අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.